# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2305/08 – 2022 නොවැම්බර් 07 වැනි සඳුදා – 2022.11.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2017/54-i.
IR/COM/04/2017/219.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2021.02.18 වැනි දින අංක 2215/41 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.02.15 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජයන්ත තිරාණගම මයා ඇතුළු සේවක පිරිස, දනවල, නෙළුව.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

තේ ශක්ති අරමුදල, 8 වන මහල, සෙත්සිරිපාය, දෙවන අදියර, බත්තරමුල්ල.

අතර පවත්නා 2021.02.10 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්. සී. ආර්. ඒ. උපාලි නිශ්ශංක ගුණසේකර මහතා වෙත යොමු කරන ලදී.


1A – G 38008 – 11 (2022/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරු එස්. සී. ආර්. ඒ. උපාලි නිශ්ශංක ගුණසේකර මහතා එම ධූරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළ යුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2021.02.15 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

EOG 11 - 0071/1

---

මගේ අංකය: IR/COM/04/2017/54-i.
IR/COM/04/2017/219.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජයන්ත තිරාණගම මයා ඇතුළු සේවක පිරිස, දනවල, නෙළුව.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

තේ ශක්ති අරමුදල, 8 වන මහල, සෙත්සිරිපාය, දෙවන අදියර, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, යක්කල, ගම්පහ පාර, නැඹිලි කොටුව වත්ත, අංක 03, රමාල් අයි. සිරිවර්ධන මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2017/54-i.
IR/COM/04/2017/219.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

ජයන්ත තිරාණගම මයා ඇතුළු සේවක පිරිස, දනවල, නෙළුව.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

තේ ශක්ති අරමුදල, 8 වන මහල, සෙත්සිරිපාය, දෙවන අදියර, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''තේ ශක්ති අරමුදල සතු කම්හල් වසා දැමීමේ හේතුව මත තේ ශක්ති අරමුදලේ සේවය කළ ජයන්ත තිරාණගම මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 08 දෙනාගේ සේවය 2016.12.31 දින සිට අවසන් කිරීමේ දී වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට අවස්ථාව තිබියදී විශ්‍රාම යැවීමේ වයස අවුරුදු 55 ලෙස සලකා වන්දි ගණනය කිරීම මගින් අසාධාරණයක් සිදුවී තිබේ ද? එසේ සිදුවී තිබේ නම් ඔවුනට ලැබිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ.''

1. ජයන්ත තිරාණගම
2. ඒ. ඩබ්. කුමාරසිරි
3. එම්. පී. නීතා රත්නකුමාරි
4. එම්. කේ. අනුර සරත් කුමාර
5. පසන් වටවල
6. ප්‍රියන්ත බාලපටබැඳි
7. ඩබ්. එම්. ධර්මසිරි
8. ඩබ්. ඩබ්. සී. සී. කුමාර

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 21 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 - 0007/2